# ලිංගික හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්තිය[1]

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයය

ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනයට සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට භාජනය වූ පුද්ගලයන් වෙනුවෙන් පැමිණිලි කිරීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම මෙම ප්‍රතිපත්තිය මගින් සිදුකෙරේ. මෙම ප්‍රතිපත්තිය මගින් 25.05.2019 දින බලාත්මක කෙරුණු ලිංගික හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්තිය ප්‍රතියෝජනය කෙරේ. එය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයේ අනුග්‍රහය ලබන පුද්ගලයින්ට හෝ ස්ථාන සම්බන්ධයෙන් බලපැවැත්වේ.

## I. ප්‍රතිපත්ති ප්‍රකාශය

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කුමක් වුවත්, විශ්වවිද්‍යාලය තුළ ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් තොරව අධ්‍යාපන කටයුතු සිදුකිරීමට සහ රැකියාවක නිරතවීමට අදාළ සියලුම පුද්ගලයින්ට උචිත පරිසරයක් පවත්වාගෙන යාමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයය කැපවී සිටියි. ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය විශ්වවිද්‍යාලයීය ප්‍රතිපත්තියට සහ නීතියට පටහැනි වේ. මානව ගරුත්වය, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය, සහ නිසි ක්‍රමවේදය කෙරෙහි පවතින ගෞරවය යන මූලික සාරධර්මමත පදනම්ව මෙම ප්‍රතිපත්තිය මගින් ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය අර්ථකථනය කිරීම, පේරාදෙණිය විශ්වවිද්‍යාලයයතුළ සිදුවන ලිංගික හිංසනය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය, ලිංගික ප්‍රචණ්ඩත්වය සහ එවන් පැමිණිලි හේතුවෙන් ඇතිවන ප්‍රතිහිංසනය වැළැක්වීම සඳහා කටයුතු කිරීම, සහ ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය විමර්ශනය සහ ඒ සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීම සඳහා අවශ්‍ය සුදුසු ක්‍රියා පටිපාටීන් ස්ථාපිත කිරීම සිදුකෙරේ.

දණ්ඩනීති සංග්‍රහයේ (1995 දී සංශෝධිත) 345 සහ 363 වගන්ති අනුව ශ්‍රී ලංකාව තුළලිංගික ස්වරූපයක් දරණ හිංසනය සහ ප්‍රචණ්ඩත්වය අපරාධයන් ලෙස ගැනෙන අතර, 1998 අංක 20 දරණ උසස් අධ්‍යාපන ආයතනයන්හි නවකවදය සහ වෙනත් ආකාරයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනතේ 2(2) වගන්තිය යටතේ උසස් අධ්‍යාපනය හා සම්බන්ධ සන්ධර්භ තුළ දැම ක්‍රියා අපරාධ ලෙස හඳුන්වා දී ඇත. ලිංගිකත්වය මත පදනම් වූ වෙනස්කොට සැලකීම් වලින් තොරවීම ඇතුළත්ව සමානාත්මතාවය සහ නීතියේ සම ආරක්ෂාව සඳහා වන අයිතිය [12 (1) සහ (2) ව්‍යවස්ථාව] සහ නීත්‍යානුකුල රැකියාවක නිරතවීමට ඇති නිදහස [14 (1)(g) ව්‍යවස්ථාව] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කොට ඇත. රැකියා ස්ථානයේ ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ එවන් හිංසනයට සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ වින්දිතයින්ට පිළියම් සැලසීම සඳහා වන

---

[1] අර්ථය පිළිබඳ යම් අපැහැදිළිතාවයක් ඇති වූ අවස්ථාවකදී මෙහි ඉංග්‍රීසි පිටපත භාවිතා කළයුතු බව කරුණාවෙන් සලකන්න.

අවශ්‍යතාවය ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය හා බැඳී සිටින ගිවිසුම් මගින් අවධාරණය කරනු ලැබ ඇත.

## II. අරමුණ සහ විෂය පථය

(අ) සියලු පුද්ගලයින්ගේ ගරුත්වය සහ සමානාත්මතාවය ආරක්ෂාවන සංස්කෘතියක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයය තුළ ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම;

(ආ) ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය ඇතිවීම වැළැක්වීම;

(ඇ) පැමිණිලි විමර්ශනය සහ විසඳීම සඳහා ක්ෂණික, ඵලදායී, සහ සාධාරණ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම;

(ඈ) ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වන වින්දිතයින්ට ප්‍රමාණවත් සහ උචිත සහාය ලබාදීම.

## III. නිර්වචනයන්

කැමැත්ත යනු ලිංගික කටයුත්තක්/හැසිරීමක් සඳහා දැනුම්වත් බවින් යුතුව, සවිඥාණිකව, සක්‍රීයව, ස්වෙච්ඡාවෙන්, තහවුරුකොට ලබාදෙන්නා වූ, අහෝසි කළ හැකි අවසරය යි. හුදෙක් විරෝධතාවයක් නොමැති වීම, ප්‍රතිරෝධයක් නොමැති වීම, හෝ නිහැඬියාව කැමැත්ත ලෙස අර්ථකථනය කළ නොහැක. ලිංගික කටයුත්තේ නිරතවීම සඳහා අන්‍යොන්‍ය වශයෙන් ග්‍රාහක කරගත හැකි වූ පැහැදිළි අවසරය වාචිකව හෝ ක්‍රියාවෙන් පලකළහැක්කේ යම් ප්‍රමාණයකට ද ඒ ප්‍රමාණයට කැමැත්ත වාචිකව හෝ ක්‍රියාවෙන් ප්‍රකාශ කළ හැකි වන්නේ ය. යම් පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය, මත්පැන්, කායික හෝ මානසික ආබාධ, හෝ සිහි මූර්ච්ඡාභාවයක් නිසා අශක්නුකෘතව සිටින්නේ නම් ඇය/ඔහු කැමැත්ත ප්‍රකාශ කිරීමට හැකි තත්ත්වයක නොසිටි යි. වයස අවුරුදු 16 ට අඩු පුද්ගලයෙකුට සිය කැමැත්ත නිදහසේ ප්‍රකාශ කළ නොහැක.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ඒ සම්බන්ධව පවතින ඒකාකෘතීන්, ලිංගික නැඹුරුතාවන්, ලිංගික අනන්‍යතාව හෝ ප්‍රකාශන යන පදනම් යටතේ සිදුවන ලිංගික ස්වභාවයක් නොදරණ, වාචික හෝ වාචික නොවන, දෘෂ්‍ය, කායික හෝ වෙනත් ගනයට ගැනෙන තර්ජන, බලහත්කාරකම්, ප්‍රචණ්ඩත්වය, බියවැද්දීම්, හෝ ඵදිරිවාදී ක්‍රියාවන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය ලෙස හැඳින්වේ.

පුද්ගල නිශ්‍රිත (subjective) මෙන්ම වාස්තවික(objective) දෘෂ්ටියකින් ගත් කල අදාළ චර්යාව යම් පුද්ගලයෙකුහට විශ්වවිද්‍යාලයයේ අධ්‍යයන කටයුතු සහ ඊකියාවන්හි නියුතුවීමට සහ ඒවායින් ප්‍රතිලාභ ලබාගැනීමට සහ/හෝ විශ්වවිද්‍යාලයයේ නේවාසික පහසුකම් භුක්ති විඳීමට බාධා ඇතිකරවන තරමේ දරුණු ගනයේ චර්යාවක් නම් සහ එය නිරන්තරව සිදුවන්නේ නම් එවිට ඵදිරිවාදී පරිසරයක් පවතින්නේ යැයි සැලකේ. නිරන්තරව හෝ පුළුල් වශයෙන් සිදුවන සිදුවීම් නිසාවෙන් හෝ හුදෙකලාව සිදුවන

සැලකියයුතු ගනයේ දරුණු සිදුවීමක් නිසාවෙන් ඒදිරිවාදී පරිසරයක් නිර්මාණය විය හැකි ය.

ප්‍රතිහිංසනය යනු යමෙකු මෙම ප්‍රතිපත්තිය යටතේ තහනම් වන යම් ක්‍රියාවක් පිළිබඳ වාර්තා කිරීම හෝ මෙම ප්‍රතිපත්තිය මගින් ස්ථාපිත කෙරෙන විමර්ශන, වාර්තාකරණ, ප්‍රතිකාර්මික, හෝ විනය ක්‍රියාමාර්ග සම්බන්ධ ක්‍රියා පටිපාටීන් සඳහා සහභාගී වීම හෝ පදනම් කොටගෙන එම පුද්ගලයාට විරුද්ධව තර්ජනය කිරීම, බියවැද්දීම, පළිගැනීම, සහ/හෝ රැකියාව හෝ අධ්‍යාපනයට සම්බන්ධ හානිදායී ක්‍රියාමාර්ග ගැනීම ය.

ලිංගික හිංසනය යනු යම් පුද්ගලයෙකු වෙත කායික, මානසික, හෝ වෙනත් ආකාරයක හිරිහැරයක් හෝ පීඩාවක් ඇතිකරවන ලිංගික වශයෙන් නිශ්චය වූ ඕනෑම ආකාරයක ක්‍රියාවකි (කායික, මානසික, අභිනයාත්මක, දෘෂ්‍ය, හෝ ලිඛිත).

ලිංගික ප්‍රචණ්ඩත්වය යනු ශාරීරික වශයෙන් වූ පහරදීම් සහ ප්‍රචණ්ඩත්වය වන අතර ස්ත්‍රී දූෂණය, ලිංගික පහරදීම, අතවර කිරීම, හෝ එවන් දේ කිරීම සඳහා උත්සාහ කිරීම හෝ යම් පුද්ගලයෙකු වෙත එම පුද්ගලයාගේ කැමැත්ත නොමැතිව දක්වනු ලබන ලිංගික ස්වභාවයකින් යුතු චේතාන්විත කායික හැසිරීම් එම ගනයට අයත්වේ.

## IV. චර්යාව

<u>පොදු ප්‍රතිපත්තිය</u>

මෙම ප්‍රතිපත්තිය මගින් පාලනය වන සියලුම පුද්ගලයින් විසින් ප්‍රතිපත්තියට පදනම් වන ආචාරධර්ම පිළිගෙන ප්‍රවර්ධනය කරනු ලබනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර ඔවුන් ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය, ලිංගික ප්‍රචණ්ඩත්වය, සහ පැමිණිලිකරුවන්ට/කාරියන්ට එරෙහි ප්‍රතිහිංසනය ක්‍රියාත්මක නොකරනු ඇති බවත්; ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය, ලිංගික ප්‍රචණ්ඩත්වය, සහ පැමිණිලිකරුවන්ට/කාරියන්ට එරෙහි ප්‍රතිහිංසනය ප්‍රවර්ධනය නොකරනු ඇති බවත්; ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය, ලිංගික ප්‍රචණ්ඩත්වය, සහ පැමිණිලිකරුවන්ට/කාරියන්ට එරෙහි ප්‍රතිහිංසනය පිළිබඳ තොරතුරු වසන් කිරීමෙන් වළකිනු ඇති බවත්; විශ්වවිද්‍යාලයය මගින් ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය, ලිංගික ප්‍රචණ්ඩත්වය, සහ පැමිණිලිකරුවන්ට/කාරියන්ට එරෙහි ප්‍රතිහිංසනය වැළැක්වීම සඳහා ගනු ලබන උත්සාහයන්ට දායකත්වය දක්වනු ඇති බවත්; සහ සියලු පුද්ගලයින්ට ඔවුන්ගේ ස්ත්‍රී-පුරුෂභාවය, ස්ත්‍රී-පුරුෂ අනන්‍යතාවය, ස්ත්‍රී-පුරුෂභාවය සම්බන්ධ ප්‍රකාශන, ලිංගික නැඹුරුතාව, හෝ ලිංගිකත්වය නොසලකා සියලුම පුද්ගලයන්ට ගරුත්වයෙන් සලකන සංස්කෘතියක් ප්‍රවර්ධනය කරනු ඇති බවත් අපේක්ෂා කෙරේ.

<u>තහනම් චර්යාවන්</u>

මෙම ප්‍රතිපත්තිය මගින් පාලනය වන සියලුම පුද්ගලයින්ට III වන කොටසේ නිර්වචනය කොට ඇති ආකාරයට සහ මෙම ප්‍රතිපත්තිය යටතේ පනවා ඇති උපලේඛන I හි සවිස්තරාත්මකව දක්වා ඇති ආකාරයට කවර ස්වභාවයක හෝලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනයක, ලිංගික ප්‍රචණ්ඩත්වයක, සහ/හෝ පැමිණිලිකරුවන්ට/කාරියන්ට එරෙහි ප්‍රතිහිංසනයක නියුතු වීම තහනම් වේ.

මෙම ප්‍රතිපත්තිය මගින් පාලනය වන කිසිදු පුද්ගලයෙකු

(අ) පුද්ගලයෙකුගේ රැකියාවේ හෝ අධ්‍යාපනයේ ප්‍රගතිය, ප්‍රතිලාභ, හෝ කටයුතු සම්බන්ධයෙන් කොන්දේසියක් වශයෙන් ඍජුව හෝ වක්‍රාකාරයෙන් ලිංගික අනුග්‍රහය සැපයීම හෝ ලිංගික ඉල්ලීම් සමග එකඟවීම නොකළයුතු ය;

(ආ) පුද්ගලයෙකු විසින් ලිංගික පෙළඹවීම් ප්‍රතික්ෂේප කරනු ලැබීම හෝ ඒවාට එකඟ නොවීම, එම පුද්ගලයාට බලපාන හෝ අදාළ වන රැකියාව හෝ අධ්‍යාපනය සම්බන්ධ තීරණ ගැනීමේ දී පාදක කර නොගත යුතු ය;

(ඇ) පුද්ගලයෙකු විසින් ලිංගික පෙළඹවීම් ප්‍රතික්ෂේප කරනු ලැබීම හෝ ඒවාට එකඟ නොවීම යන පදනම මත එම පුද්ගලයාගේ රැකියාව හෝ අධ්‍යාපනය සම්බන්ධ කාර්ය සාධනය කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇතිකිරීමෙන් වැළකී සිටිය යුතු සේ ම, ඇයට/ඔහුට තර්ජනාත්මක, සතුරු, හෝ පීඩාකාරී වාතාවරණයක් නිර්මාණය කිරීම හෝ වෙනත් පුද්ගලයින් ලවා නිර්මාණය කිරවීම නොකළ යුතු ය;

(ඈ) ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය, ලිංගික ප්‍රචණ්ඩත්වය, සහ/හෝ පැමිණිලිකරුවන්ට/කාරියන්ට එරෙහි ප්‍රතිහිංසනය සම්බන්ධ විධිමත් හෝ අවිධිමත් පැමිණිලි වසන්කිරීම නොකළ යුතු ය;

(ඉ) තොරතුරු සහ සන්නිවේදනය සම්බන්ධ තාක්ෂණය (ICT) ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය, ලිංගික ප්‍රචණ්ඩත්වය, සහ/හෝ පැමිණිලිකරුවන්ට/කාරියන්ට එරෙහි ප්‍රතිහිංසනය සම්බන්ධ කටයුතු සඳහා භාවිත නොකළ යුතු ය.

පුද්ගලිකව හෝ කණ්ඩායමක් වශයෙන් තනි පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට එරෙහිව ක්‍රියාත්මක කරනු ලබන ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ/හෝ ලිංගික ප්‍රචණ්ඩත්වය සහ/හෝ පැමිණිලිකරුවන්ට/කාරියන්ට එරෙහි ප්‍රතිහිංසනය සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයයේ පාලක සභාව මගින් විනය ක්‍රියාමාර්ග ගැනෙනු ලැබේ.

විශ්වවිද්‍යාලය විසින් තහනම් චර්යාවන් පිළිබඳ වාර්තාවන් සම්බන්ධයෙන් ක්ෂණික සහ ඵලදායී පියවර ගනු ලබන අතර ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මෙම ප්‍රතිපත්තිය උල්ලංඝනය කෙරෙන චර්යාවන් වළක්වාලීමට, නිවැරදි කිරීමට, සහ අවශ්‍ය විටෙක එවන් චර්යාවන් හික්මවාලීමට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## V. මෙම ප්‍රතිපත්තිය මගින් පාලනය වන පුද්ගලයින් සහ ස්ථාන

i. විශ්වවිද්‍යාල පනතෙන් ව්‍යුත්පන්න අධිකාරී බලය භාවිතා කරනු ලබන සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන සියලු දෙනා මෙම ප්‍රතිපත්තියේ පාලනයට යටත් වන්නෝ වේ. විශ්වවිද්‍යාල පරිපාලකයෝ; අධ්‍යයන, අධ්‍යයන සහායක, සහ අනධ්‍යන කාර්ය මණ්ඩලය (තාවකාලික, කොන්ත්‍රාත්, හෝ බාහිර කාර්ය මණ්ඩලය ඇතුළත්ව); ශිෂ්‍ය ශිෂ්‍යාවෝ; ස්වෙච්ඡා සේවක සේවිකාවෝ; සහ විශ්වවිද්‍යාලයීය කටයුතු පැවරී ඇති

විශ්වවිද්‍යාලයට පරිබාහිර ආයතනයන්හි සේවක සේවිකාවෝ මේයටතට ගැනෙති.

ii. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ මෙන් ම එම පරිශ්‍රයෙන් පරිබාහිරව විශ්වවිද්‍යාලයයේ අනුග්‍රහය යටතේ සිදුකෙරෙන සියලු කටයුතු මෙම ප්‍රතිපත්තිය යටතේ පාලනය වේ. පැමිණිලිකරු/කාරිය සහ වගඋත්තරකරු/කාරිය තම තමන්ගේ නිල තත්ත්වයෙන් රැඳී සිටින්නා වූ ශික්ෂණ, පර්යේෂණ, සහ නේවාසික පහසුකම් සහිත පරිශ්‍රයන්; සායන සහ රෝහල්; ක්ෂේත්‍ර ස්ථාන; ක්ෂේත්‍ර චාරිකා; සහ හෝටල් ආදී ස්ථාන මෙම ප්‍රතිපත්තිය මගින් විශ්වවිද්‍යාල පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන ක්ෂේත්‍රය යටතට ගැනේ.

iii. මෙම ප්‍රතිපත්තියෙන් ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වයහා සම්බන්ධ ක්‍රියාවන්ට අදාළ සිදුවීම් ආවරණය කෙරේ.

(a) විශ්වවිද්‍යාල ප්‍රජාවට අයත්වන අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ශිෂ්‍ය සේවා නියුක්තිකයන්, ක්‍රීඩා පුහුණුකරුවන්/කාරිණියන්, පර්යේෂණ සහකරුවන්/කාරියන්, සීමාවාසික සේවකයන්/සේවිකාවන්,මෙන්ම විශ්වවිද්‍යාල වැඩසටහන් වලට සහභාගී වන නමුත්ශිෂ්‍ය ශිෂ්‍යාවන් නොවන හෝ කාර්ය මණ්ඩලයට අයත් නොවන පුද්ගලයින් අතර;

(b) දූරාවලියේ ඉහළ සහ පහළ ස්ථානගත පුද්ගලයින් අතර හෝ සමානයන් අතර; සහ

(c) ඕනෑම ස්ත්‍රී-පුරුෂ සමාජභාවයක් හෝ අනන්‍යතාවයක් නියෝජනය කරනු ලබන පුද්ගලයින් අතර සිදුවන සිද්ධීන්.

මෙහිදී ගැටළුකාරී චර්යාව තක්සේරු කිරීමේ දී එම චර්යාව විද්‍යාමාන වුණු සමස්ත ක්‍රියාදාමය ම අවධානයට ලක්කෙරේ.

මෙම ප්‍රතිපත්තිය විශේෂයෙන් ම අධ්‍යාපන ආයතනයන් තුළක්‍රියාත්මක කිරීමේදී, භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කිරීමේ වැදගත්කම අවධාරණය වන අයුරින් ක්‍රියාත්මක කෙරේ.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(a) වගන්තියෙන් භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස යටතේ සුරක්ෂිත කර ඇති මෙන්ම නීත්‍යානුකූල ඉගැන්වීමේදී, ඉගෙනුමේදී, සහ පන්තිකාමරයේදී සහ ඉන් පරිබාහිර සංසදයන්හිදී පීඨ සාමාජිකයෙකු/සාමාජිකාවක විසින් සිදුකරනු ලබන සමාජ විචාර හෝ සිසුන් විසින් සිදුකරනු ලබන අධ්‍යාපනික, දේශපාලනික, කලාත්මක, හෝ සාහිත්‍යාත්මක ප්‍රකාශනද ඇතුළත් වන විද්වත් කටයුතු වලදී භාවිතා වන ප්‍රකාශනාත්මකචර්යාව තහනම් වන ආකාරයට මෙම ප්‍රතිපත්තිය අර්ථකථනය නොකෙරේ.

## VI. යාන්ත්‍රණයන්

වගකිවයුතු අධිකාරීන්

පේරාදෙණිය විශ්වවිද්‍යාලයයේ පාලක සභාව විසින් "ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වයනිරීක්ෂණය සඳහා වන කමිටුව

(CMSGBHSV)" නමැති කමිටුවක් පත්කළයුතුය. මෙම කමිටුව සඳහා බාහිර සාමාජිකයින් (අභිරුචිතර වශයෙන් නෛතික පසුබිමක් සහිත)තිදෙනෙක්ද (03) ඇතුළුව සමස්ත සාමාජිකයින් පහළොස්දෙනෙකු (15) ගෙන් සමන්විත වියයුතු වන අතර එම සාමාජිකයින් ප්‍රමාණවත්අයුරින් ස්ත්‍රී-පුරුෂ නියෝජනයක් වියයුතු අතර ම විශ්වවිද්‍යාල ප්‍රජාවගේ බහුවිධභාවය ද නිරූපණය කළ යුතු ය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාවක් දක්වා ඇති, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ කරුණු කෙරෙහි සමානාත්මතාවය සහ සමසාධාරණත්වය පාදක කොටගත් දෘෂ්ටියකින් කටයුතු කිරීමේ උනන්දුවක් පෙන්වා ඇති, සහ ලිංගික හිංසනය සහ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටලු විමර්ශනය සම්බන්ධයෙන් පුහුණුවක් ලබා ඇති පුද්ගලයින් මෙහි සාමාජිකයින් වශයෙන් පත්කරගත යුතු වේ. අවශ්‍ය අවස්ථාවන්හිදී අනාකෘතික නිරාකරණ ක්‍රමවේදයක් වෙනුවෙන්,උපකුලපතිගේ සහ අදාළවෙනත් පාර්ශවයන්ගේ උපදෙස් යටතේ සමථකරුවන්/කාරියන් පත්කිරීමට CMSGBHSV වෙත බලය ඇත.

ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ පැමිණිලි භාරගැනීම සහ තෝරාගැනීම, උපකුලපතිගේ ඉල්ලීම මත බැලූබැල්මට පෙනෙන සාක්ෂි එකතුකිරීම සඳහා මූලික විමර්ශන පැවැත්වීම, සහ පැමිණිලි සම්බන්ධයෙන් ගතයුතු යෝග්‍ය ක්‍රියාදාම උපකුලපති වෙත නිර්දේශ කිරීම මෙම කමිටුව විසින් සිදුකරනු ලැබේ.

පැමිණිලි ඉදිරිපත් කළ හැක්කේ කාටද?

මෙම ප්‍රත්පත්තිය මගින් පාලනය වන සියලු පුද්ගලයින්ට (මෙම ප්‍රතිපත්තියේ V කොටස බලන්න) මෙන් ම විශ්වවිද්‍යාලයයට පැමිණෙන ආගන්තුකයින්ට සහ/හෝ හිංසනයට ලක්වී යැයි සැලකෙන පුද්ගලයා සමග පෞද්ගලික මට්ටමෙන් හෝ වෘත්තීය මට්ටමෙන් සම්බන්ධවන තුන්වන පාර්ශවයන්ට හෝ සිදුවී යැයි පැවසෙන හිංසනය ඇසින් දුටු පාර්ශවයන්ට පැමිණිලි ඉදිරිපත් කළ හැකි ය.

අපේක්ෂිත ක්‍රමවේදය

පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු ආකෘතිය සහ පටිපාටිය සහ මූලික විමර්ශනයේදී, සමථකරණයේදී, සහ/හෝ විධිමත් විමර්ශනයේදී අනුගමනය කළ යුතු පටිපාටීන් මෙම ප්‍රතිපත්තිය යටතේ පනවා ඇති අතුරු ව්‍යවස්ථාව මගින් පාලනය වේ.

මෙම ප්‍රතිපත්තිය යටතේ අනුගමනය කෙරෙන පටිපාටීන් අපක්ෂපාතී, සාධාරණ, ක්ෂණික, සහ විශ්වසනීය ආකාරයට මෙන් ම තහනම් චර්යාව පිළිබඳව චෝදනා ලැබ සිටින විත්තිකරුගේ/කාරියගේ හිමිකම් ආරක්ෂා කිරීමද ඇතුළත් වන නිසි ක්‍රමවේදයේ නියමයන් ප්‍රවර්ධනය වන ආකාරයට සිදුකළ යුතු ය.

අභියාචනා

විශ්වවිද්‍යාලය විසින් පැමිණිල්ලක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක්ගනුනොලැබූ අවස්ථාවකදී හෝ පැමිණිලිකරු/කාරිය හෝ වගඋත්තරකරු/කාරිය විශ්වවිද්‍යාලයය විසින් ගනු ලැබූ විනය ක්‍රියාමාර්ගය පිළිබඳ සෑහීමකට පත් නොවන අවස්ථාවකදී ඇයට/ඔහුට අභියාචනයක් ඉදිරිපත්කිරීමේ හැකියාව පවතී. අභියාචනය ලැබුණු පසු පවත්නා විනය

පටිපාටියට අනුව එය විභාග කිරීම සඳහා පාලක සභාව විසින් කමිටුවක් පත්කළයුතු ය. මෙම කමිටුව විසින් සිය නිගමන සහ අභියාචනය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගයේ ස්වභාවය පිළිබඳ නිර්දේශ පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

විශ්වාසනීයත්වය

සියලු පැමිණිලි සම්බන්ධයෙන් විශ්වාසනීයත්වය ආරක්ෂා කළ යුතු ය. සම්මුඛ සාකච්ඡා සම්බන්ධ පටිගතකිරීම් (ඇත්නම්), ලිපි ගනුදෙනු, ලිපිලේඛන, සහ වාර්තා එළිදරවු කළ යුත්තේ බලයලත් පුද්ගලයින්ට පමණි. විමර්ශනයට සම්බන්ධ යම් පුද්ගලයෙකු විසින් විශ්වසනීයත්වය සම්බන්ධ නියමය කඩකරනු ලැබී යැයි බව සොයාගැණුනහොත්, ඇයව/ඔහුව විමර්ශන ක්‍රියාවලියෙන් ඉවත්කරන ලෙස කෙරෙන නිර්දේශයද සමග උපකුලපති වෙත වාර්තාකළ යුතු ය.

වාර්තා කිරීම සඳහා වන කාලරාමුව

වාර්තා කිරීම සඳහා නිශ්චිත කාලසීමාවක් නොපවතින නමුත්, සාධාරණ කාලපරාසයක් තුළදී පැමිණිලි ඉදිරිපත් කළ යුතු ය. පැමිණිල්ලේ ස්වභාවය සැලකිල්ලට ගෙන, උපකුලපති සහ CMSGBHSV විසින් සාධාරණ කාලපරාසය කුමක් විය යුතුද යන්න තීරණය කළ යුතු ය. එයට අදාළ හේතු සාධක මොනවාද යන්න අදාළ පාර්ශව වෙත දැනුම්දිය යුතු ය.

විනය ක්‍රියාමාර්ග

අධයයන, අධ්‍යයන සහායක, පරිපාලන, හෝ අනධ්‍යන කාර්ය මණ්ඩල වල ඕනෑම සාමාජිකයෙක්/සාමාජිකාවක්, ඕනෑම ශිෂ්‍යයෙක්/ශිෂ්‍යාවක්, ඕනෑම සේවා සපයන්නෙක්/සපයන්නියක්, හෝ ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැරදිකරුවකු වූ ඕනෑම පුද්ගලයෙක් විනය ක්‍රියාමාර්ග වලට මුහුණදීමට බැඳී සිටියි. එකම වරදකරුවකු/කාරියක අතින් එකම ස්වභාවයේ වරදක් නැවතත් සිදුකිරීමට යෙදුණහොත් එම පසුව සිදුකෙරුණු වරද වඩාත් වැඩි දඬුවමකට ලක්කළයුතු ය. විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXIIවන පරිච්ඡේදයට අනුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලයයේ පාලක සභාව විසින් වරදකරු බවට සනාථ වූ පුද්ගලයාට/පුද්ගලයින්ට සුදුසු දඬුවමක් තීරණයකර නියම කරනුලබයි.

## VII. වැළැක්වීම සඳහා ගනුලබන ක්‍රියාමාර්ග

i. මෙම ප්‍රතිපත්තිය සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවට ම පහසුවෙන් ලබාගතහැකි විය යුතු ය. එය සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂාවලින් සහ බ්‍රේල් ක්‍රමයට ලබාගතහැකි වියයුතු අතර ශිෂ්‍ය අත්පොත්, විශ්වවිද්‍යාල වාර්ෂික (Calendar) වාර්තාවෙහි, සහ විශ්වවිද්‍යාල වෙබ්අඩවියෙහි එය අන්තර්ගත විය යුතු ය. මෙම ප්‍රතිපත්තිය වෙත අවධානය යොමුකරවන, සහ හදිසි අවස්ථාවකදී සම්බන්ධ කරගත යුතු පුද්ගලයින් සම්බන්ධ කරගතහැකි ක්‍රම පිළිබඳ විස්තර ඇතුළත්, එක් පිටුවකින් සමන්විත විස්තර පත්‍රිකාවක් විශ්වවිද්‍යාලයය මගින් පිළියෙල කර එය පීඨ පරිශ්‍රයන්ට අමතරව, ශිෂ්‍ය ආපනශාලා, පොදු කාමර, නේවාසික ශාලා, ක්‍රීඩාගාරය, විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය, සහ

විශ්වවිද්‍යාලය සතු අමුත්තන් සඳහා වූ පරිශ්‍රයන් ආදියෙහි දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කළ යුතු ය.

ii. සියලු කාර්ය මණ්ඩල වල සාමාජිකයින් වෙත නිකුත්කරනු ලබන සේවා ගිවිසුම් සහ පත්වීම් ලිපිවල මෙම ප්‍රතිපත්තිය සම්බන්ධ වගන්තියක් අන්තර්ගත කළ යුතු ය.

iii. විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන ශිෂ්‍ය අනුස්ථාපන වැඩසටහන් වලදී මෙම ප්‍රතිපත්තිය පිළිබඳ සාකච්ඡා කළ යුතු ය.

iv. විශ්වවිද්‍යාලයයේ අධ්‍යයන, අධ්‍යයන සහායක, පරිපාලන, හෝ අනධ්‍යන සේවකයින් වෙනුවෙන් පවත්වනු ලබන කාර්ය මණ්ඩල සංවර්ධන සහ පුහුණුකිරීමේ වැඩසටහන් වලට ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය සහ සමසාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සහ රැකියා ස්ථානයෙහි ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාවය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් සැසියක් ඇතුළත් කළ යුතු ය. එවන් වැඩසටහන්වලට මෙම ප්‍රතිපත්තිය සම්බන්ධ සැසියක් අන්තර්ගත කළ යුතු ය. නේවාසිකාගාර වල ශාලාධිපතීන්/ශාලාධිපතිනියන් සහ උප ශාලාධිපතීන්/උප ශාලාධිපතිනියන් වෙනුවෙන් මෙම ප්‍රතිපත්තිය පිළිබඳව විශේෂ පුහුණු සැසි පැවැත්විය යුතු ය.

v. විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය සංගම්හි ව්‍යවස්ථාවන්ටමෙම ප්‍රතිපත්තිය සහ අධ්‍යාපන ආයතනයන්හි නවකවදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත සම්බන්ධ යොමුවක් ඇතුළත් කළ යුතු ය.

vi. විශ්වවිද්‍යාලයයට පරිබාහිර සේවා සපයන්නන් සමග ගිවිසුම් ගතවන සේවා ගිවිසුම් වලදී එවන් ගිවිසුමකට ඇතුළත්වන ඕනෑම පාර්ශවයක් මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට බැඳීසිටින බව දැක්වෙන ප්‍රතිපාදනයක් විශ්වවිද්‍යාලය විසින් ඇතුළත් කළ යුතු ය.

vii. ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ එවන් හිංසනය සහ ප්‍රචණ්ඩත්වය හා සබැඳි ප්‍රතිවිපාක ආමන්ත්‍රණය කිරීම ඉලක්ක කොටගත් පුහුණු උපදේශන සේවාවක් විශ්වවිද්‍යාලයය විසින් සැපයිය යුතු ය. මෙම ප්‍රතිපත්තිය යටතේ සිදුකෙරුණු ඕනෑම පැමිණිල්ලකට සම්බන්ධ සියලු පාර්ශවයන් වෙත එම සේවාව විවෘත විය යුතු ය.

viii. යම් පැමිණිල්ලක් අධිකරණයක විභාග කරවාගැනීමට අගතියට පත් පාර්ශවයට අවශ්‍ය නම් විශ්වවිද්‍යාලයය විසින් ඒ සඳහා සහාය ලබාදිය යුතු ය.

## VIII. රැකදීමේ වගන්තිය

ලිංගික හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්තිය යටතේ ආරම්භ වී ඇති මූලික විමර්ශන සහ පරීක්ෂණ ඇතුළු සියලු කටයුතු මෙම ප්‍රතිපත්තිය යටතේ ආරම්භ වී යැයි සැලකිය යුතු වන අතර, එම ක්‍රියාවන් මෙම ප්‍රතිපත්තිය යටතේ ඉදිරියට කරගෙන යායුතු ය.